(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

**අංක 1(12).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 ජූනි 20 බ්‍රහස්පතින්දා**

---

**2024 ජූලි 09** අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යාව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආගමන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 ජනවාරි 12 දිනැති අංක 2366/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2024 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර සඳහා අයකරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 පෙබරවාරි 01 දිනැති අංක 2369/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2024 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 මැයි 17 දිනැති අංක 2384/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.06.18 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

සමාධි භාවනා හා යෝගා මධ්‍යස්ථාන (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2024 ජූලි 23 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1704/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල මේ වනවිට සේවය කරනු ලබන අනියම් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවයේ ස්ථිර නොකිරීමට හේතු කවරේද;

(iii) ඔවුන් මේ වනවිට කරනු ලබන රාජකාරි කවරේද;

(iv) එම සේවකයන්ට ගෙවනු ලබන වැටුප කොපමණද;

(v) ඔවුන් සේවයේ ස්ථිර කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1729/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ මේ වනවිට පවතින අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත සඳහන් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග හේතුවෙන් මරණයට පත් වූ සහ තුවාල ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සඳහා ආරක්ෂිත දුම්රිය ගේට්ටු සවිකිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1739/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය, කින්නියා මූලික රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට ඉහත රෝහලේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත රෝහලේ සේවය කරනු ලබන වෛද්‍යවරුන් හා හෙදියන් සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත රෝහලේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1751/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ගොවිසෙත' ලොතරැයිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ලොතරැයිය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(iii) ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එම ලොතරැයිය අලෙවි කිරීම මඟින් උපයන ලද ආදායම සහ ප්‍රදානය කරන ලද ත්‍යාග මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ලොතරැයිය අලෙවි කිරීම මඟින් උපයන ලද ආදායම ගොවි ජනතාවගේ සුභසාධනය සඳහා වැය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1878/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිසුන් සංඛ්‍යාව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා විෂයය ධාරාව අනුව ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ සිසුන්ගෙන් බහුතරයක් අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා හෝ ගණිත විෂයය ධාරාව වෙත යොමු කරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1910/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම් පිහිටා ඇති ස්ථාන;

(ii) එම ඉඩම්වලින් භාවිතා කර ඇති ඉඩම් ප්‍රමාණය, ඌන උපයෝජිත ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන;

(iii) ඉහත (i)හි සඳහන් ඉඩම්වලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අයිතිය යටතේ පවතින ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඌන උපයෝජිත ඉඩම් අන්සතු කිරීම හෝ බදු දීම සම්බන්ධයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට අන්සතු කර හෝ බදු දී ඇති ඉඩම් ප්‍රමාණය හා එම ඉඩම් පිහිටා ඇති ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1914/2024

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරි වර්ෂ 05 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඉදිරි වර්ෂ 05 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

(iii) එම විදුලිබල අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඉදිරි වර්ෂ 05 තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1918/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා විදේශගත වී ඇති ශ්‍රී ලාංකික කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ගෘහ සේවය සහ වෙනත් රැකියා ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සංඛ්‍යාව පුහුණු ශ්‍රමිකයන් හා නුපුහුණු ශ්‍රමිකයින් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම කාන්තා ශ්‍රමිකයන්ගේ සුභසාධනය සඳහා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1943/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි අර්බුදය තවදුරටත් පවතින්නේද;

(ii) විදුලි අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ බලපෑම කවරේද;

(iii) එම විදුලි අර්බුදය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය සැපයීම් අංශය මඟින් ඖෂධ සැපයුම්කරුවන්ට මේ වනවිට ගෙවීමට ඇති මුදල කොපමණද;

(ii) වංචා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ගවලට එළැඹ ඇති සැපයුම් සමාගම්වලට මුදල් ගෙවා තිබේද;

(iii) එසේ නම්, එම සැපයුම් සමාගම් කවරේද;

(iv) එම එක් එක් සැපයුම් සමාගමට ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මුදල් ගෙවීම ප්‍රමාද වී ඇති ඉහත (අ)(ii)හි සඳහන් සැපයුම් සමාගම් නොවන ඖෂධ සැපයුම් සමාගම් කවරේද;

(ii) එම එක් එක් සැපයුම් සමාගමට ගෙවීමට ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුදල් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් එම සැපයුම් සමාගම්වලට පොළියක් ලබා දෙන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 ජූලි 24 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගෙන ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට අයිති ඉඩම්වලින් අඩකට වඩා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ අත්පත් කර ගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සම්බන්ධයෙන් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) අනවසර පදිංචිකරුවන් වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා මේ වනවිට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලැස්ම කවරේද;

(vi) අදාළ ආයතන සහ බලධාරීන් විසින් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

42/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඹුරුපිටිය, මීරිස්වත්ත වලව්වේ පදිංචිව සිටි සාරා ලෝරෙන්සිනා විජේසිංහ මැතිනිය විසින් තම දෙමාපියන් සිහිවීම පිණිස මාතර, රාහුල විද්‍යාලයට පරිත්‍යාග කරන ලද ගුණතිලක ස්මරණ ශාලාව කඩා ඉවත් කරන ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම ශාලාව කඩා ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) එය කඩා ඉවත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුණතිලක ස්මරණ ශාලාව වෙනුවට ඉදිකරනු ලබන නව ස්මරණ ශාලාව සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල ලබා ගැනීමට අපේක්ෂිත මූලාශ්‍ර කවරේද;

(iii) නව ස්මරණ ශාලාව ඉදිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුදල් ලබා දී තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නව ස්මරණ ශාලාවේ ඉදිකිරීම්වලින් මේ වනවිට නිම කර ඇති ප්‍රමාණය කොපමණද;

(ii) ඉතිරි කොටස නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1970/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන/ආයතන කවර කාලයක් සඳහා ලියාපදිංචි කරනු ලබන්නේද;

(ii) වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල/ආයතනවල ලියාපදිංචිය දීර්ඝ කිරීම සඳහා අය කරනු ලබන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1993/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2023.07.01 දින පොලිස් නිලධාරීන් සමඟ පැමිණි සෙවනගල සීනි කර්මාන්ත ශාලාවේ පාලන අධිකාරිය විසින් ඕංඩුම නිවාස සංකීර්ණයේ නිවාසවල ජලය හා විදුලිය විසන්ධි කර ඇති බවත්;

(ii) විශ්‍රාම ගන්වන අවස්ථාවේදී යැපෙන්නන් බඳවාගැනීමට හෝ පදිංචිය සඳහා ඉඩමක් ලබා දීමට, 1983-1986 කාලයේදී එම නිවාස සංකීර්ණයේ නිවාසවල සේවකයන්ව පදිංචි කරවන අවස්ථාවේදී පාලන අධිකාරිය විසින් පොරොන්දු වී ඇති බවත්;

(iii) වර්ෂ 30-40ක් තිස්සේ එම නිවාසවල පදිංචි වී සිටිමින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එම සේවකයන් ක්‍රියා කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පදිංචිව සිටින සේවකයන්ට අසාධාරණ ලෙස සලකමින් ආයතනයේ ඉඩම් කැබලි පදිංචි වීම සඳහා වෙනත් බාහිර පුද්ගලයන්ට ලබා දෙන බව දන්නේද;

(ii) ඉහත නිවාසවල පදිංචි වී සිටින සේවකයන්ට තවදුරටත් එම නිවාසවල රැඳී සිටීමට අවසර දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

2009/2024

ගරු මයන්ත දිසානායක මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර නගරය සංවර්ධන කිරීම වෙනුවෙන් ඒ අවට ඉඩම් රජයට පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් හිමිකරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ පවරා ගනු ලැබූ ඉඩම් සඳහා වන්දි ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iii) එක් එක් ඉඩම් හිමිකරුවකු සඳහා ලබා දී ඇති වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2025/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඉල්ලා ඇති බව එවකට මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2021.02.10 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලද බව දන්නේද;

(ii) එම අනුමතිය ලබා දී ඇති දිනය කවරේද;

(iii) එම ආයතනය සඳහා සුදුසු ආයෝජකයෙක් හඳුනාගෙන කැඳවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසුරුවා හැරීමට අවසර ඉල්ලා ශ්‍රී ලංකා මහ බැංකුව 2021.02.15 දින වාණිජ මහාධිකරණයේ අංක CH/19/2021/CO. දරන නඩුව ගොනු කර ඇති බවත්;

(ii) එය ඉහත (අ)(i)හි සඳහන් ප්‍රකාශයට පටහැනි බවත්;

(iii) එමඟින් ඉහත ආයතනයේ තැන්පත්කරුවන් ව්‍යාකූලත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme (SLDILSS) හි අරමුදල් භාවිතා කරමින් අගතියට පත් වූ එක් තැන්පත්කරුවෙකු සඳහා රු. 500,000 බැගින් ලබා දෙන දිනය කවරේද;

(ii) ඉහත අරමුදලේ ඇති රුපියල් බිලියන 60ක මුදල භාවිතා කරමින් අදාළ තැන්පත්කරුවන්ට සම්පූර්ණ මුදල ලබා දිය හැකිද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2046/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රතිපාදන මත ගල්තුඩේ-අටුළුගම-විදාගම මාර්ගයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද බවත්;

(ii) ඉහත මාර්ගය දෙපස ඉඩම්වල පදිංචිකරුවන් වන්දි ලබා ගැනීමකින් තොරව තම නිවාස හා ආරක්ෂිත තාප්ප ඉවත් කර මාර්ගය පුළුල් කිරීම සඳහා අවස්ථාව ලබා දුන් බවත්;

(iii) මේ වනවිට එම මාර්ගයේ සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම නතර කර ඇති බවත්;

(iv) මේ හේතුවෙන් ඉහත මාර්ගයට යාබද අටුළුගම, අල් ගස්සාලි විද්‍යාලයේ ඉගෙනුම ලබන සිසුන් 3000කට අධික පිරිසක් ඇතුළු ප්‍රදේශයේ විශාල ජනතාවකට පා ගමනින් හෝ ගමන් කිරීමට නොහැකිවීම හේතුවෙන් දුෂ්කරතාවයන්ට ලක්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ සංවර්ධන කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2056/2024

ගරු වේලු කුමාර් මහතා,— අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1992 වර්ෂයේදී රජයේ වතු ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද අවස්ථාව වනවිට මහනුවර දිස්ත්‍රික්කයේ, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් බෝහිල් වතුයායේ තිබූ ඉඩම් කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉඩම් කොටස්වල නම් කවරේද:

(iii) ඉහත කොටස් අතරින් වර්ෂ 2015 වනවිට වගා නොකර අත්හැර දැමූ කොටස් පැවතියේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1992 සිට 2015 දක්වා වූ කාලයේදී ඉහත වතුයායේ ඉඩම් කොටස්/ ගොඩනැගිලි බාහිර පුද්ගලයන්ට/පෞද්ගලික ආයතනවලට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් පුද්ගලයාගේ/පෞද්ගලික ආයතනයේ නම සහ ලබා දෙන ලද ඉඩම්/ගොඩනැගිලි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් එක් එක් ඉඩම් කොටසේ/ගොඩනැගිල්ලේ පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද,

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2078/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා සේවය හැර ගොස් ඇති යුද හමුදාවේ සෙබළුන් හා නිලධාරින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ට සේවය හැර යාම සඳහා බලපා ඇති සාධක කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අපරාධ සංඛ්‍යාව වැඩි වීම සඳහා මෙලෙස සේවය හැර ගිය යුද හමුදා සොල්දාදුවන්ගේ නීති විරෝධී ක්‍රියාකාරකම් හේතු වී තිබේද;

(iv) එම ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2086/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රක්නා ලංකා ආරක්ෂක සමාගම විසින් ඇවන්ට්ගාර්ඩ් සමාගමට ලබා දී තිබූ ගිනි අවි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගිනි අවි අතරින් ඇවන්ට්ගාර්ඩ් සමාගම විසින් මේ දක්වා ආපසු භාර දී ඇති ගිනි අවි සංඛ්‍යාව සහ ආපසු භාර දී නොමැති ගිනි අවි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආපසු භාර දී නොමැති ගිනි අවි නැවත ලබා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 ජූලි 25 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

312/2024

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා මේ වනවිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) සූර්ය බල විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(iii) සූර්ය බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

360/2024

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්);

(ii) පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය හා රාජ්‍ය අනුබද්ධිත යන වර්ගීකරණය යටතේ ක්‍රියාත්මක වන පෙර පාසල්;

(iii) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය යටතේ අධ්‍යාපනය ලබා දෙන පෙර පාසල්;

(iv) පෙර පාසල් අධ්‍යාපනය ලබන දරුවන්;

(v) පෙර පාසල් අධ්‍යාපනය නොලබන වයස අවුරුදු 3-5 අතර දරුවන්;

(vi) පෙර පාසල් පාලක පාලිකාවන්;

සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දරුවන් පෙර පාසල් අධ්‍යාපනය නොලැබීමට බලපා ඇති හේතු කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මුළු පෙර පාසල් ගුරුවරුන් සංඛ්‍යාව, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පූර්ව ළමාවිය අධ්‍යාපන ඩිප්ලෝමාධාරී ගුරුවරුන් සංඛ්‍යාව, මුළු පෙර පාසල් ගුරුවරුන්ගේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පෙර පාසල් සඳහා පොදු විෂය නිර්දේශයක්/පොදු පාඨමාලාවක් සහ පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අත්පොතක් තිබේද;

(iv) පෙර පාසල් නියාමනය කිරීමට ක්‍රමවේදයක් තිබේද;

(v) නොඑසේ නම්, ඒවා ක්‍රියාත්මක වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

370/2024

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති ආයතනවල සේවය කරන ලද අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයන් 2019 වර්ෂයෙන් පසුව ඉවත් කර තිබේද;

(ii) එසේ ඉවත් කර ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද එම සේවකයන් නැවත සේවයට කැඳවන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සේවකයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

375/2024

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට තායිලන්තයේ ප්‍රතිකාර ලබන මුතුරාජා හස්තියා ශ්‍රී ලංකාවේදී වද හිංසාවලට ලක්වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iii) මුතුරාජා හස්තියා නැවත ශ්‍රී ලංකාවට රැගෙන ඒමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ හීලෑ අලින් වද හිංසාවලට ලක්කිරීම් පිළිබඳව වාර්තා වී තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

382/2024

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාහන වායු විමෝචන භාරකාර අරමුදල පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එම අරමුදල පිහිටුවීමේ අරමුණු/පරමාර්ථ කවරේද;

(iii) එම අරමුදලේ සාමාජිකයන් කවරේද;

(iv) වායු විමෝචන සහතික නිකුත් කරනු ලබන ආයතන විසින් ඉහත අරමුදල වෙත මාසිකව ලබා දිය යුතු මුදල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) ඒ අනුව ආරම්භ කරන ලද වර්ෂයේ සිට මේ දක්වා එම ආයතනවලින් ඉහත අරමුදලට ලැබී ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලේ ආරම්භක අරමුණ/පරමාර්ථ අනුව කටයුතු කිරීම සඳහා දිගුකාලීන සංයුක්ත සැලැස්මක් හෝ වාර්ෂික ක්‍රියාකාරි සැලසුම්, අරමුදලේ භාරකාර මණ්ඩලය විසින් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

(iii) එම සැලසුම්වලට අනුව අරමුදල විසින් මේ දක්වා වැය කර ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

468/2024

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ඖෂධ ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලයේදී විවිධ හේතු නිසා භාවිතයෙන් ඉවත් කරන ලද ඖෂධ සංඛ්‍යාව සහ එම ඖෂධවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඖෂධ, භාවිතයෙන් ඉවත් කිරීමට බලපාන ලද හේතු සාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඖෂධ ගබඩා කිරීම සම්බන්ධයෙන් විගණන වාර්තාවේ දක්වා ඇති විමසුම් කවරේද;

(ii) එම විගණන විමසුම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

513/2024

ගරු රෝහණ බංඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහකනදරාව ව්‍යාපාරය යටතේ මේ වනවිට වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපාරය යටතේ කුඹුරු වගා කරන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) මහකනදරාව ව්‍යාපාරය යටතේ කුඹුරු වගා කරනු ලබන ගොවීන්ට වාරිමාර්ග නිලධාරින් විසින් තර්ජනය කර ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

544/2024

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දේශපාලන පළිගැනීම්වලට ලක් වූ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් විමර්ශන කර තිබේද;

(iii) එම විමර්ශන අනුව සහන ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) සහන නොලැබූ සේවකයන්ට ඉදිරියේදී සහන සැලසීමට කටයුතු කරන්නේද;

(v) සහන ලබා නොදෙන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා රජය විසින් රෝපණය කිරීම සඳහා ලබා දී ඇති පොල් පැළ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවා ලබා දෙන ලද ප්‍රදේශ සහ පැළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පොල් පැළ නිසි පරිදි වර්ධනය වන්නේදැයි පසුවිපරම් කරන්නේද;

(iv) එම පොල් පැළ අතරින් නිසි පරිදි වර්ධනය වෙමින් පවතින පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

(v) ඉදිරි වර්ෂය සඳහා බෙදා දීමට අපේක්ෂිත පොල් පැළ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1245/2024

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඩු ආදායම්លාභී පවුල් සඳහා රැකියා ලක්ෂයක් ලබා දීමේ වැඩසටහන යටතේ පළමු අදියරේදී බඳවාගන්නා ලද රැකියාලාභීන් සංඛ්‍යාව, දෙවන අදියරේදී බඳවාගන්නා ලද රැකියාලාභීන් සංඛ්‍යාව සහ බඳවාගන්නා ලද රැකියාලාභීන් අතරින් මේ වනවිට සේවයේ යෙදී සිටින රැකියාලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට සේවයේ යෙදී සිටින රැකියාලාභීන් සඳහා ස්ථිර රැකියා ස්ථානයක් ලබා දී තිබේද;

(iii) ස්ථිර රැකියා ස්ථානයක් ලබා නොදුන් රැකියාලාභීන් සිටී නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත රැකියාලාභීන් සේවයේ ස්ථිර කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 ජූලි 26 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

595/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 මැයි 09 දින හා ඊට ආසන්න දිනවල ශ්‍රී ලංකාවේ ඇති වූ කලබලකාරී වාතාවරණය අවස්ථාවේදී නිවාසවලට/දේපළවලට/කාර්යාලවලට හානි සිදු වූ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්/හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන්/පළාත් පාලන මන්ත්‍රීවරුන් හා වෙනත් පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් මන්ත්‍රීවරයාගේ/පුද්ගලයාගේ වත්කම්වලට සිදු වූ හානිවල වටිනාකම වෙන් වෙන් වශයෙන් සහ එම හානි සිදු වූ වත්කම්වල මුළු වටිනාකම කොපමණද;

(iii) එම කලබලකාරී අවස්ථාවේදී හානි සිදු වූ රජයේ/පොදු දේපළ කවරේද;

(iv) එම එක් එක් දේපළවලට සිදු වූ හානියේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) රජයේ/පොදු දේපළවලට සිදු වූ හානියේ මුළු වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

612/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1978 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ රජය සතුව පැවති රාජ්‍ය සංස්ථා, අධිකාරී, මණ්ඩල සහ වෙනත් නිෂ්පාදන හා සේවා ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම සහ කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i)හි සඳහන් ආයතන අතරින් මේ වනවිට ක්‍රියාත්මක වන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් ආයතනයේ රජයේ හිමිකාරීත්වය ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) සඳහන් නිෂ්පාදන/සේවා ආයතනයන්ගෙන් පෞද්ගලීකරණය කර ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, කරන ලද නිෂ්පාදනය/සපයන ලද සේවාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (අ)(i) සඳහන් ආයතන අතරින් මේ වනවිට බංකොලොත් වී ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු පොල් නිෂ්පාදනය එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී මුළු පොල් නිෂ්පාදනය උච්චාවචනය වී ඇති ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කොපමණද;

(ii) තේ අපනනය කිරීමෙන් එම වර්ෂයේදී උපයාගෙන ඇති ආදායම කොපමණද;

(iii) තේ පර්යේෂණ ආයතනය සහ පොල් පර්යේෂණ ආයතනය ඇතුළු වැවිලි බෝග සඳහා පිහිටුවා ඇති පර්යේෂණ ආයතන විසින් 2023 වර්ෂයේදී සිදු කර ඇති පර්යේෂණ සංඛ්‍යාව කොපමණද;

(iv) එම පර්යේෂණවල ප්‍රධාන සොයාගැනීම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති කල්බදු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) විධිමත් පරිදි ලියාපදිංචි කර නොමැති කල්බදු සමාගම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) කල්බදු සමාගම් විසින් විවිධ පොලී අනුපාත අය කිරීම හේතුවෙන් එම සමාගම් සමඟ ගිවිසුම්ගත වී ඇති පාර්ශ්වයන් දැඩි අපහසුතාවකට පත් වී ඇති බව දන්නේද;

(iv) එම සමාගම් විසින් අය කරනු ලබන පොලී අනුපාතයන් නියාමනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මේ වනවිට ක්‍රියාත්මක කර තිබේද;

(v) කල්බදු පහසුකම් ලබා ගන්නා ලද ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1129/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය;

(iii) එම ඉඩම් අතරින් මේ වනවිට ඔප්පු ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය;

(iv) ඉදිරියේදී ඔප්පු ලබා දීමට නියමිත ඉඩම් ප්‍රමාණය;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1156/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා පමණක් අවසර ලබා දී ඇති වාහනවල මගීන් ප්‍රවාහනය කළ හැකිද;

(ii) එම වාහනවලින් මගීන් ප්‍රවාහනය කරනු ලබන බව දන්නේද;

(iii) එම වාහනවල මගීන් ප්‍රවාහනය කිරීම සඳහා ලබා දී ඇති නෛතික බලය කවරේද;

(iv) අනාරක්ෂිත ලෙස මගීන් ප්‍රවාහනය කරනු ලබන වාහන අනතුරුවලට ලක් වීම හේතුවෙන් මිය යන පුද්ගලයන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2019 වසරේ ශ්‍රී ලංකාවේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් ‘චැනල් 4’ නාලිකාව විසින් එල්ල කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ ප්‍රගතිය;

(ii) ඉහත කොමිෂන් සභා වාර්තාව මෙම සභාවට සහ මහජනතාවට ලබා දෙනු ලබන දිනය; සහ

(iii) එම විමර්ශනයේ ප්‍රගතියක් නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රහාර සම්බන්ධයෙන් ‘චැනල් 4’ නාලිකාව විසින් එල්ල කරන ලද එම චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට හේතු;

(ii) ඉහත කාරක සභාවේ ප්‍රගතිය;

(iii) ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු; සහ

(iv) ඉහත කමිටුවේ පරාමිතීන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එකී ප්‍රහාර සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කරන ලද ඉල්ලීම් රජය දිගින් දිගටම නොසලකා හැර තිබීමට හේතු කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1254/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු ඉරු දින ප්‍රහාරයට පෙර පුත්තලම, වනාතවිල්ලුව ප්‍රදේශයේ ඉඩමක තිබී පුපුරන ද්‍රව්‍ය සොයා ගන්නා ලද බව දන්නේද;

(ii) ඊට අදාළ පරීක්ෂණ මෙහෙයවන ලද පොලිස් නිලධාරින්ගේ නම් හා තනතුරු නාම කවරේද;

(iii) එම පරීක්ෂණ අඛණ්ඩව ක්‍රියාත්මක නොකළ බව පිළිගන්නේද;

(iv) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ එම පරීක්ෂණ සම්බන්ධයෙන් සඳහන් කර ඇති කරුණු කවරේද;

(v) ඉහත පරීක්ෂණ නිසි පරිදි සිදු කළේ නම්, පාස්කු ඉරු දින ප්‍රහාරය වළක්වා ගත හැකිව තිබූ බව පිළිගන්නේද;

(vi) පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති චූදිතයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1288/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් මේ වනවිට තාක්ෂණික විෂය ධාරාව ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පාසල් සිසුන් අතර තාක්ෂණික විෂය ධාරාව ප්‍රචලිත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2005/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.31 දින වනවිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, එක් එක් ඖෂධ සැපයුම්කරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉන්දියානු රජයේ ණය ආධාර මත ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ඖෂධ වෙනුවෙන් 2024.01.31 දින වනවිට ඉන්දීය ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, එක් එක් ඖෂධ සැපයුම්කරු අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?